# ශ්‍රී ලංකාවේ නවසූත මරණ හා පශ්චාත් නවසූත මරණ සඳහා බලපාන ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ ආර්ථික සාධක (ශ්‍රී ලංකා ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය- 2016 ඇසුරින්)

කේ.ඩී.ආර්.එස්. සිරිවර්ධන - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ලංකාවේ ළදරු මරණවල ආංශික වශයෙන් පවතින අසමතුලිත වූ මරණ ප්‍රවණතාවේ ව්‍යාප්තිය මූලික ගැටලුව කර ගනිමින් ළදරු මරණවලට හේතුවන සාධකවල බලපෑම කුමන ආකාරයෙන් වෙනස් වනවාද, එසේ වැඩි වශයෙන් බලපෑම් කරනුයේ කුමන සාධක ද යන ගැටලුකාරී තත්වයන්ට විසඳුම් සෙවීම තුළ ශ්‍රී ලංකාවේ නවසූත හා පශ්චාත් නවසූත මරණ සඳහා බලපාන ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ ආර්ථික සාධක අධ්‍යයනය පර්යේෂණයේ මූලික අරමුණ වේ. උපඅරමුණු යටතේ ශ්‍රී ලංකාවේ නවසූත, පශ්චාත් නවසූත හා ළදරු මරණවල නිශ්චායක හා රටා හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ නවසූත හා පශ්චාත් නවසූත මරණ සඳහා බලපාන ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ ආර්ථික සාධක අධ්‍යයනය කිරීම සිදු වේ. අධ්‍යයනය ද්විතීයික දත්ත මත පදනම් වන අතර 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද පස්වැනි ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණයේ දත්ත මෙයට මූලික පදනම සපයයි. සමීක්ෂණයේදී නියැදිය ලෙස නිවාස ඒකක 28, 720ක් තෝරා ගෙන ඇත. එහිදී 27, 210ක් සාර්ථකව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අතර සුදුසුකම් ලත් කාන්තාවන් 18,500ක් හඳුනා ගෙන ඇත. මෙම අධ්‍යයනයේ උපනියැදිය වශයෙන් ප්‍රධාන නියැදිය මගින් ලබා ගන්නා නවසූත මරණ 60ක් සහ පශ්චාත් නවසූත මරණ 21ක් යොදා ගන්නා ලදි. ශ්‍රී ලංකාවේ නවසූත, පශ්චාත් නවසූත හා ළදරු මරණ පුම්තිරිබාවය අනුව සලකා බැලීමේදී පිරිමි දරුවන්ගේ මරණ ඉහළ වන අතර ආංශික තත්වය අනුව ග්‍රාමීය - නාගරික අංශ සලකා බැලීමේදී ග්‍රාමීය අංශය ඉහළ මරණ ප්‍රවණතාවක්ද ග්‍රාමීය - වතු අංශ සලකා බැලීමේ දී වතු අංශය ඉහළ මරණ ප්‍රවණතාවක්ද, නාගරික - වතු අංශ සලකා බැලීමේ දී වතු අංශය ඉහළ ප්‍රවණතාවක්ද ගෙන ඇත.. 1987, 2006/07 හා 2016 ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණ දෙස බලන විට යම් පහළ යාමක් වර්තමානයේදී දක්නට ඇත. නවසූත හා පශ්චාත් නවසූත මරණ සඳහා බලපාන ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ, ආර්ථික සාධක ලෙස දරුවාගේ පුම්තිරිබාවය, උපතේ දී මවගේ වයස, පදිංචිය හා මවගේ අධ්‍යාපන තත්වය සැලකිල්ලට ගෙන ප්‍රතිශතයක් ලෙස බැලූ විට නවසූත හා පශ්චාත් නවසූත මරණ සඳහා ඉහත සාධක යම් බලපෑමක් සිදු කරන බවත්,  එහිදී පිරිමි දරුවන් ගැහැණු දරුවන්ට සාපේක්ෂව මිය යන බවත්, උපතේ දී මවගේ වයස ඉහළ හා පහළ මට්ටම්වල පැවැතීමේදී එය දරුවා කෙරෙහි බලපෑම් කරන බවත්, පදිංචියේ ස්භාවය සමාජීය සහ ආර්ථික වශයෙන් දරුවාගේ මරණයට බලපාන බවත්, මවගේ අධ්‍යාපන මට්ටම හා දරුවාගේ මරණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් ඇති බවත් තහවුරු විය.

***ප්‍රමුඛ පදඃ*** *නවසූත මරණ,  පශ්චාත් නවසූත මරණ,  ළදරු මරණ*